# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date | 2025.10.22 පැය 0610 | දුරකථන අංකය Tel.NO | 011-2887973 |
| මගේ අංකය My NO | D/Media/Out/1924/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු</u>

**01. ඉෂාරා සෙව්වන්දි නැමති සැකකාරියට සැඟව සිටීමට හා පලා යාමට ආධාර අනුබල දුන් සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.**

2025.02.19 වන දින අළුත්කඩේ අධිකරණ සංකීර්ණය තුලදී ඝාතනය වූ සංවිධානාත්මක අපරාධකරුවෙකු වූ සංජීව කුමාර සමරරත්න නොහොත් ගණේමුල්ල සංජීව නැමැත්තාගේ ඝාතනයට සම්බන්ධ ඉෂාරා සෙව්වන්දි නැමති සැකකාරියට සැඟව සිටීමට ආධාර අනුබල දුන් සැකකරුවෙකු හා ඉන්දියාවට මුහුදු මාර්ගයෙන් බෝට්ටුවක් ආධාරයෙන් පලා යාමට ආධාර අනුබල දුන් සැකකරුවෙකු 2025.10.20 වන දින කිලිනොච්චිය උදයනගර් ප්‍රදේශයේදී හා තිහාරිය, ඕගොඩපල ප්‍රදේශයේදී කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරුවන් අවුරුදු 29 හා 42 වයස්වල පසුවන යාපනය හා කිලිනොච්චිය ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

සැකකරුවන් පැය 72 ක රැඳවුම් නියෝග මත රඳවා තබාගෙන කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. නාඳුනන මෘත ශරීරයක් හමුවීම - මරදාන පොලිස් වසම.**

2025.10.21 වන දින සවස් කාලයේ මරදාන පොලිස් වසමේ බේරේ වැවේ පුද්ගල මෘත ශරීරයක් පාවෙමින් ඇති බවට ලද තොරතුරක් මත මරදාන පොලිස් ස්ථානය මගින් විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරුගේ අනන්‍යතාවය මෙතෙක් තහවුරු වී නොමැති අතර වයස අවුරුදු 55 ත් 60 අතර වයසේ පසුවන පිරිමි පුද්ගලයෙකි. කළුපාට දිග කලිසමක් හා කොළ පැහැති අත්දිග කමිසයක් හැද සිට ඇත.**

හදිසි මරණ පරීක්ෂණයෙන් පසු මෘත ශරීරය කොළඹ ජාතික රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර මරදාන පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. මෙරට නිෂ්පාදිත ගිනි අවි 02 ක් හා වාලම්පුරි 02 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා දකුණු පළාත් විශේෂ මෙහෙයුම් ඒකකය.**

2025.10.21 වන දින සවස් කාලයේ අම්බලන්ගොඩ පොලිස් වසමේ උඩකැලෑව ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා දකුණු පළාත් විශේෂ මෙහෙයුම් ඒකකයේ නිලධාරීන් කණ්ඩායමකට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර මෙරට නිෂ්පාදිත ගිනි අවි දෙකක් හා වාලම්පුරි දෙකක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන අම්බලන්ගොඩ පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 55 ක් වන උඩකැලෑව, මීටියාගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අම්බලන්ගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**04. මාරක රිය අනතුරක් - කළුවංචිකුඩි පොලිස් වසම.**

2025.10.21 වන දින උදෑසන කාලයේ කළුවංචිකුඩි පොලිස් වසමේ කල්මුණෙ මඩකලපුව ප්‍රධාන මාර්ගයේ කළුදාවලි ප්‍රදේශයේදී කල්මුණෙ දෙස සිට මඩකලපුව දෙසට ධාවනය වූ ලොරි රථයක් මාර්ගය හරහා ගමන්ගත් පදිකයෙකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ පදිකයා කළුවංචිකුඩි රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරුගේ අනන්‍යතාව මෙතෙක් තහවුරු වී නොමැති අතර ප්‍රදේශයේ සිටින යාචක පුද්ගලයෙකු බවට අනාවරණය වී ඇත.**

මෘත ශරීරය කළුවංචිකුඩි රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. ලොරි රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර කළුවංචිකුඩි පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**